තනතුරු - ඇබෑර්තු

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

**2022.12.31 දිනට උතුරු මැද පළාතේ පුරප්පාඩු වන පාසල් සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් පත්කිරීම.**

උතුරු මැද පළාතේ විදුහල්පති තනතුර පුරප්පාඩුව පවතින හා 2022.12.31 දිනට පුරපාඩු වීමට නියමිත 1AB, 1C, Type 2 හා Type3 යන වර්ගීකරණයට අයත් පාසල් 176ක් සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්:

I. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු යි. වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන සක්‍රීය හා සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබිය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

02. තෝරා ගැනීමේ ක්‍රමය:

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අනුමත ලකුණු පටිපාටිය හා පුරප්පාඩු පවතින ලැයිස්තුව www.cm.nc.gov.lk හා www.edncp.lk යන වෙබ් අඩවිවල පළ කර ඇත.)

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් , ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2022.12.27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින්, "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, 5 වන මහල, උතුරු මැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "උතුරු මැද පළාතේ විදුහල්පති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප

කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රය www.cm.nc.gov.lk හා www.edncp.lk යන වෙබ් අඩවි වලින් බාගත කරගත හැකි ය)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

එන්.එච්.ආර්.නිශාන්ත,
ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය දී ය.